Inception: 1930 Reg. No: 736

# සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය

# තනතුරු පුරප්පාඩු

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමුපකාර සමිතියකි.

මෙම සමිතියේ පුරප්පාඩු වී ඇති කළමනාකරණ සහකාර සහ කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා කුසලතා පූර්ණ, උද්යෝගිමත් සහ කැපවීමෙන් යුතුව වැඩ කිරීමේ හැකියාව ඇති අදාළ සුදුසුකම් සැපිරූ අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර - 0 (මෙහෙයුම් ශ්‍රේණිය III වන පන්තිය)

**සුදුසුකම් :**

අ.පො.ස උසස් පෙළ සාමාර්ථය සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සාමාන්‍ය පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් හතරකට සම්මාන තිබීම. හෝ

ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්වීම සහ ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සාමාන්‍ය පෙළ සාමාර්ථය සමඟ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසරක පළපුරුද්ද හෝ

කාර්යාල කළමනාකරණ විෂයට සම්මාන සහිතව ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සාමාන්‍ය පෙළ සාමාර්ථය සමඟ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්ද හෝ

කාර්යාල කාර්ය සහායක තනතුරේ I පන්තියේ වසර 05 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :** මාසික 21,700 - 250X10 - 275X10 - 26,950/-

ඉහත මාසික වැටුපට අමතරව ජීවන වියදම් දීමනා සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ගෙවනු ඇත.

## කාර්යාල කාර්ය සහායක - S.1. (සහාය ශ්‍රේණිය II වන පන්තිය)

**සුදුසුකම් :**

දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ භාෂාවට සාමාර්ථ සමඟ අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂයයන් 06 කින් සමත්වීම.

**වැටුප් පරිමාණය :** මාසික 18,600 - 190X10 - 200X10 - 22,500/-

ඉහත මාසික වැටුපට අමතරව ජීවන වියදම් දීමනා සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ගෙවනු ඇත.

**පොදු කොන්දේසි :**

- අයදුම්කරුවන් වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුයි.
- ජීව දත්ත සහිත සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද ඇතුළත්ව තමා විසින්ම සකස් කළ අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතු අතර, දැනටමත් ඔබ සමුපකාර සමිතියක සේවය කරයි නම්, අදාළ අයදුම්පත්‍රය එම සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය.
- මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත වන අතර, තෝරා ගනු ලබන අයගේ වැටුපෙන් 10% ක්ද, ආයතනයෙන් 15% ක්ද සමඟ සේවක අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
- තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද දැක්වෙන සහතිකවල පිටපත්ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ද සමඟ අයදුම්පත්‍රය 2022.04.07 දින දහවල් 12.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.


**ප්‍රධාන ලේකම්,**

**සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**

**අංක 294, ගාලු පාර, කොළඹ 03.**

**දුරකථන අංකය : 0112370717 ෆැක්ස් : 0112577475 විද්‍යුත් තැපෑල : edcshrsec@gmail.com**